## ඒ සොරුන් හැර වෙනත් සොරුන් සිටිත්ද? පව්කාරයයින්ට ගල්ගැසීම හෙවත් රාජපක්ෂ විරෝධයෙන් ඔබ්බට

# අර්බුදයේ මූල හේතුව සහ ජාතකය කුමක්ද?



අප රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට ආර්ථික අර්බුදය උත්සන්නවීම මුල්කරගෙන ජනාධිපතිවරයෙකුට තම ධුර කාලය අවසන් වීමට පෙර ධුරය අතහැර රටින් පලා යෑමට සිදු විය. නමුත් එම අර්බුදයේ උපත කෙසේ සිදුවීද යන්න සහ ඊට මුල් වූ හේතු, ප්‍රතිපත්ති හෝ ක්‍රියාදාමයන් සහ පුද්ගලයින් පිළිබඳ ගැඹුරු සමාජ අවබෝධයක් ඇති නොවීය. ගෝඨාභය රාජපක්ෂයන් ද ශ්‍රී වික්‍රම රාජසිංහයන් මෙන් තම හිස දන් දීම සඳහා තමා විසින්ම කරුණු පෙළගැස්වූ බැවින් ''පව්කාරයාට ගල් ගසා" නිහඬ වීමට ජනතාවට අවස්ථාව ලැබුණි. ශ්‍රී වික්‍රම රාජසිංහයන් අඩු තරමින් අවසාන මොහොතේ දී හෝ රටේ ජනතාවට පණිවිඩයක් ලබා දීමට එඩිතර විය. ඔහු බ්‍රිතාන්‍යයන්ගේ අත්අඩංගුවට පත් වීමේදී රැස්ව සිටි ජනතාව පැවසුවේ ''මට නැති වුණේ කිරුළ පමණයි. ඒත් නුඹලාට නුඹලාගේ රට නැති වෙනවා" යනුවෙනි. ගෝඨාභයගේ කටින් පිට නොවූ එම වචන දැන් යථාර්ථයක් බවට පත් වෙමින් තිබුණ ද පොදු මහජනයා යැයි හඳුන්වන පිරිසට ඒ පිළිබඳ වගේ වගක් නැත. එහෙත් අප රටේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 නොවැම්බර් 14 දින ප්‍රකාශයට පත් කළ නඩු තීන්දුව නිසා ''අර්බුදයට වගකිවයුත්තන් කවුද? සහ අර්බුදය නිර්මාණය වූයේ කෙසේද?" යන්න පිළිබඳව සමාජයේ යම් සංවාදයක් මතු වී ඇත.

ඒ අනුව පාර්ලිමේන්තුවේදී අදහස් දක්වමින් එම්. ඒ. සුමන්තිරන් මන්ත්‍රීවරයා සඳහන් කළේ වැරදිකරුවන් ලෙස නම් කළ ප්‍රධාන වගඋත්තරකරුවන් වූ මහින්ද, ගෝඨාභය සහ බැසිල් යන රාජපක්ෂ සහෝදරයන් ත්‍රිත්වයේ ප්‍රජා අයිතිය අහෝසි කළ යුතු බව ය. එහෙත් එක් නඩුවක පළමු වගඋත්තරකරු ලෙස වත්මන් ජනාධිපතිවරයා නම්කර තිබුණද ඔහුට අදාළව කිසිවක් නඩු තීන්දුවේ සඳහන්ව නැත. ඒ පිළිබඳව හෝ අර්බුදයට අදාළව ඔහුගේ භූමිකාව පිළිබඳව වචනයක් හෝ සඳහන් නොකිරීමට සුමන්තිරන් මහතා පරිස්සම් විය. ඊට අමතරව අර්බුදයට මූල හේතුව වූ පරපෝෂිත සහ පරාධීන ආර්ථික මොඩලය වෙනස් කළ යුතු බවට ඔහු විසින් හඬක් නැගුවේ නැත. ඔහු ප්‍රමුඛ දෙමළ ඩයස්පෝරාවට දූෂණය, වංචාව ප්‍රවර්ධනය කෙරෙන එම ආර්ථික මොඩලය පමණක් නොව ඒ තුළින් නිර්මාණය වූ අර්බුදය ද ආශිර්වාදයක් වූ බවට විවාදයක් නැත. සුමන්තිරන්ලා මහින්ද සහ ගෝඨාභය සහෝදරයින්ගේ හිස ඉල්ලා සිටින්නේ ඔවුන් ආර්ථික ඝාතකයින් වීම නිසා නොව, බෙදුම්වාදී යුද්ධය පරාජය කර තම කේවල් කිරීමේ බලය බිඳීමට මුල් වූ නිසා බව ඉතා පැහැදිලි කරුණකි.

එසේම ආගමික අන්තවාදී බලවේගවලට ද දූෂිත ආර්ථික මොඩලය ආශිර්වාදයකි. ඔවුන්ට මුදල් පොම්ප කරන ජාවාරම්කාර ව්‍යාපාරිකයන් අයුතු ලාභ ලබන්නේ එම මොඩලය විසින් නිර්මාණය කරන අවස්ථා ප්‍රයෝජනයට ගනිමිනි. වැට් බදු සහ ආදායම් බදු මෙන්ම රේගු බදු සහ ආනයන බදු වංචා කළ නොහැකි ආර්ථික මොඩලයක් තුළ අන්තවාදීන් අතට නිදහසේ මුදල් ගලා එන්නේ නැත. පාස්කු ප්‍රහාරයට පසුව ගෝඨාභය රාජපක්ෂයන් විසින් 'වහබ්වාදය' ශ්‍රී ලංකාවේ භූමියෙන් අතුගා දැමීම සඳහා යෝජනා 57ක් අඩංගු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම යනු ආගමික අන්තවාදීන් කිසිසේත්ම සමාව නොදෙන කරුණකි. එම ප්‍රවේශය සාමාන්‍ය මුස්ලිම් ජනතාවගේ යහපතට හේතු වුවත් අන්තවාදය මත යැපෙන දේශපාලන පක්ෂ නායකයින් කිහිපදෙනෙකු සතුටු කිරීම සඳහා බැසිල් රාජපක්ෂ විසින් එම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ක්‍රියාත්මක කිරීම වැළැක්වූ බව රහසක් නොවේ. එහෙත් අන්තවාදයට අදාළව ගෝඨාභයගේ චේතනාව ඔහු පලවා හැරීම සඳහා මූලික සුදුසුකමක් බවට විවාදයක් නැත. ඊනියා අරගලය සමයේදී ගෝල්ෆේස් පිටිය අසල යාඥා කරන පිරිස අදාළ ජන අනුපාතයට වඩා සිය ගුණයකින් වැඩි වූ බව පැහැදිලිව දක්නට ලැබුණි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ ආශිර්වාදයෙන් සිදු වූ රුපියල් මිලියන 15,000ක සීනි බදු වංචාවට මුල් වූ පුද්ගලයෙකු විසින් ඊනියා අරගලකරුවන්ට දිනපතා බුරියානි ලබාදෙන්නේ පුද්ගලිකව ඔහු කෙරෙහි වන වෛරය නිසා බවට ද තර්ක කළ හැක.

කෙසේ වෙතත් රාජපක්ෂලාට විශේෂයෙන්ම බැසිල් රාජපක්ෂට එරෙහිව එල්ල වූ දූෂණ, වංචා චෝදනා මහජනයාට වැදගත් නොවූ බව ඒ මගින් අදහස් නොවේ. බැසිල් රාජපක්ෂට '10% ලේබලය' වදින්නේ ඔහුගේ ගුරුවරයා වූ ගාමිණී දිසානායකගෙන් ලැබුණු 'මහවැලි කොමිස්' අධ්‍යාපනය නිසා බව දන්නෝ දනිති. රාජපක්ෂලාට මෙන්ම දිසානායකලාට හෝ ප්‍රේමදාසලාට දූෂණ, වංචා මගින් මුදල් ඉපැයීමට සහ බලය ලබා ගැනීම සඳහා එම මුදල් යෙදවීමට අවස්ථාව ලැබෙන්නේ 1977 සිට ආරම්භ වූ කොල්ලකාරී ආර්ථික මොඩලය නිසා බව ඉතා පැහැදිලි කරුණකි. රාජපක්ෂ පාලන සමයේදී යටිතල පහසුකම් ව්‍යාපෘති රාශියක් දියත් වූ බැවින් ඔවුන්ට වැඩි වශයෙන් කොමිස් ලබා ගැනීමට අවස්ථාව නිර්මාණය වූ බව බව ද සත්‍යයකි. එහෙත් ආර්ථික මොඩලය පිළිබඳව එනම් දූෂණයට, වංචාවට ඉණිමං බඳින ක්‍රමවේද පිළිබඳව විවේචනයකින් තොරව සහ රාජපක්ෂලා හැර සෙසු හොරුන් පිළිබඳ කතා නොකර රාජපක්ෂ විරෝධය පමණක් මතු කිරීම තර්කානුකූල නොවේ. නමුත් එසේ සිදු වන්නේ රාජපක්ෂ විරෝධයට හේතු වන ඉහත සඳහන් කළ විශේෂිත හේතු නිසා බව බැහැර කළ නොහැකි තර්කයකි.

ඊට අමතරව පවතින මැතිවරණ ක්‍රමය තුළ සහ ඊට අදාළ සංස්කෘතිය තුළ සාන්තුවරයෙකු මැතිවරණයට ඉදිරිපත් වුව ද අඩු තරමින් දෙවන වර සිට ජයග්‍රහණය සහතික කර ගැනීම සඳහා දූෂණ, වංචා සරණ යාමට සිදු වන බවට කිසිදු සැකයක් නැත. ඒ සඳහා පොළොඹවන පිරිසක් ද මෙම ආර්ථික මොඩලය තුළ නිර්මාණය වී ඇත. ඉහත සඳහන් කළ ආකාරයට සීනි බදු වංචාව මගින් තමාට ලැබුණු රුපියල් මිලියන 15,000ක් උඩ සාක්කුවේ දමාගත් ජාවාරම්කාරයාට මිලදීගත නොහැකි දේශපාලකයෙක් හෝ නිලධාරියෙකු සිටී නම් එය ආශ්චර්යයකි. දේශපාලනඥයින්ගේ සහ නිලධාරීන්ගේ ආශිර්වාදයෙන් දූෂණය සහ වංචාව ඉහළ යන්නේ ඒ ආකාරයටය. නමුත් ඉන්දියාවේ ඒ ආකාරයට බදු සහන දීම මගින් රජයේ ආදායම් වංචා කිරීමට ඉඩක් නැත. ඒ නිසා රජයේ අරමුදල් භාවිතා කරමින් පුද්ගලයින් මිලදී ගැනීමට ජාවාරම්කාරයින්ට අවස්ථාව ලැබෙන්නේ නැත. ඉන්දියාවේ සිදු වන්නේ හිතවතුන්ට ආර්ථික ඉඩප්‍රස්ථා නිර්මාණය කිරීම මගින් ඔවුන්ගේ ලාභයෙන් කොටසක් ලබාගැනීමය. එනම් ඉන්දියානු ව්‍යාපාරිකයින් සෘජු සහ වක්‍ර අල්ලස් දේශපාලකයින්ට සහ නිලධාරීන්ට ලබාදෙන්නේ නීතියට අනුව තමා උපයන ලාභයෙනි. ඒ නිසා ඊට ස්වාභාවිකවම සීමාවන් පැනවේ. රජයේ අරමුදල් වංචා කිරීම මගින් අල්ලස් දෙන විට ඉතා නිර්ලෝභී වන බැවින් දූෂණය සහ වංචාව හෙවත් ලෝභය චක්‍රීයව වර්ධනය වේ.

නමුත් අධිකරණය නිගමනවලට එළඹීමේදී ඒ සියලු ඓතිහාසික සාධක හෙවත් ආර්ථික මොඩලයේ විකාශනය සහ සමාජ සංස්කෘතික සාධක සැලකිල්ලට ගන්නේ නැත. එසේම යම් දේශපාලන පක්ෂයක් හෝ පක්ෂ කිහිපයක් එක්ව ආණ්ඩුවක් වශයෙන් අනුමත කරන සහ අනුගමනය කරන දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති සහ ඊට අදාළ දේශපාලන න්‍යායයන් පිළිබඳව විනිශ්චයන් ලබා දෙන්නේ නැත. එවැනි කරුණු සැලකිල්ලට ලක් වන්නේ ඒවා ව්‍යවස්ථාවට හෝ නීතියට පටහැනි වන අවස්ථාවල සහ මහජන යහපත නොතකා අසද්භාවයෙන්, නොසැලකිලිමත්ව හෝ අගතිගාමීව ඒවා ක්‍රියාත්මක කිරීම මගින් මහජන විශ්වාසය බිඳවට්ටන අවස්ථාවකය. කෙසේ වෙතත් අදාළ නඩු තීන්දුව මගින් සීනි බදු වංචාව හෝ රාජපක්ෂ සහෝදරයින් විසින් සිදු කළ බව කියන සෙසු වංචා මගින් ආර්ථික අර්බුදය නිර්මාණය කළ බවට තීන්දුවක් ලබා දී නැත. එසේම 2022 මාර්තු 03 වැනිදා මුල්‍ය මණ්ඩලය විසින් රුපියල පා කිරීම බලවත් වරදක් ලෙස කරුණු දක්වා තිබියදී 2022 මාර්තු 07 වැනිදා නැවත රැස්වී රුපියල් පා කිරීමට තීන්දු කිරීම මගින් අර්බුදය වර්ධනය කිරීම බලවත් නොසැලකිලිමත්භාවයක් හෝ බලපෑමකට යටත් වීමක් ලෙසට අධිකරණයට කරුණු ඉදිරිපත් වී නැත.

ඒ වෙනුවට සිදු වී ඇත්තේ රුපියල පා නොකිරීම වරදක් ලෙසට කරුණු දැක්වීමය. ඊට අමතරව වත්මන් මහ බැංකු අධිපතිවරයා විසින් 2022 අප්‍රේල් 12 වැනි දින පාර්ලිමේන්තුවෙන් සහ අමාත්‍ය මණ්ඩලයෙන් පූර්ව අනුමැතියක් ලබාගැනීමෙන් තොරව බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම මගින් අර්බුදය උත්සන්න වූ බවට ද කරුණු ඉදිරිපත් වී නැත. එහෙත් ආර්ථික විද්‍යා දැනුම් පද්ධතිය තුළ යම් දේශපාලන ආර්ථික විද්‍යා න්‍යායාත්මක පාර්ශ්ව දරන මතවාද අනුව ඒ ක්‍රියාවලි දෙකම සිදු නොකළ යුතු සහ අර්බුදය වර්ධනය කිරීමට හේතු වන බව පිළිගැනේ. ප්‍රායෝගිකව ගත්විට රුපියල පාලනයකට යටත්ව ක්‍රමයෙන් අවප්‍රමාණය කිරීම වෙනුවට එකවර නිදහසේ පා කිරීම මගින් ඩොලරයේ අගය අහස උසට යෑම නිසා දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය මිල ඉහළ ගොස් ඇත. ඒ නිසා ලෝක වෙළඳපළ තුළ තරගකාරීත්වය බිඳවැටීම හේතුකොටගෙන ඇඟළුම් කර්මාන්තය වැනි අංශවලින් රටට ලැබෙන විදේශ විනිමය ආදායම පහත වැටී අර්බුදය තවදුරටත් උත්සන්න වීමට හේතු වී ඇත. කෙසේ වෙතත් එහිදී අධිකරණයට එක් න්‍යායකට වඩා වෙනත් න්‍යායක් වඩා යෝග්‍ය බවට තීරණය කළ හැක්කේ සැලකිය යුතු තරම් සාක්ෂි සහිතව විශේෂඥ මතයක් අධිකරණයට ඉදිරිපත් වුවහොත් ය. ඊට අමතරව අදාළ නඩුවේ විෂය වී ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ පාලන කාලය පමණි. ඊට හේතුව පෙත්සම්කරුවන් විසින් කරුණු දක්වන්නේ එම කාලයට අදාළව පමණක් නිසා විය හැක. එහෙත් වත්මන් දූෂිත ආර්ථික මොඩලය ආරම්භය වූ 1977 දක්වා නොගිය ද 2015 - 2019 කාලය තුළ ගනු ලැබූ යම් පරිපාලන තීන්දු ගෝඨාභය රාජපක්ෂ පාලන කාලය තුළදී අර්බුදය උත්සන්න කිරීමට හේතු වූ බව අංක ගණිතයමය වශයෙන් දැක්විය හැක.

උදාහරණයක් ලෙස 2015 - 2019 කාලය තුළ සිදු වූ දේශීය බැඳුම්කර වංචාව ඒ අතුරින් ප්‍රධාන වේ. ඊට අමතරව

ඩොලර් බිලියන 12ක් පමණ වූ ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ විශාලතම ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීමේදී 6.8% සිට 7.2% දක්වා ඉහළ පොලියක් තීරණය කිරීම සඳහා විනිවිදභාවය සහිතව කටයුතු නොකිරීම මගින් සිදු වූ බවට චෝදනා එල්ල වන බරපතළ වංචාව පිළිබඳව අධිකරණයේදී සැලකිල්ලට භාජනය වී නැත. ඊට අදාළ චෝදනාව ජනමාධ්‍යවලින් හෙළිදරව් කරනු ලැබුවේ මහබැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයෙකු වූ පී. සමරසිරි මහතා විසිනි. නමුත් ගෙවුම් ශේෂ අර්බුදය මෙන්ම ණය අර්බුදය ද උත්සන්න වීමට එසේ ඉහළ පොලියකට අතිවිශාල බැඳුම්කර ප්‍රමාණයක් නිකුත් කිරීම ප්‍රධාන හේතුවක් බව සංඛ්‍යාත්මකව සහ ආර්ථික විද්‍යාත්මකව පිළිගත හැක. ඊට අමතරව එම කාලයේදී විදේශ විනිමය පනත සංශෝධනය කිරීම මගින් කළු වෙළෙඳපොළ දිරිමත් කිරීම ද අර්බුදයට අදාළ ප්‍රධාන හේතුවක් බව ඉතා පැහැදිලිය. එසේ වුවත් ඒ පිළිබඳව අධිකරණයට විනිශ්චයක් දීමට බලය ඇත්තේ එම පනත සම්මත වීමට පෙර අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් වූවානම් හෝ ජනාධිපතිවරයා විසින් කරුණු විමසා සිටින්නේ නම් පමණි. අප රටේ ව්‍යවස්ථාව අනුව අධිකරණයට පරමාධිපත්‍ය බලය ලැබෙන්නේ ව්‍යවස්ථාදායකය හරහා ය. එනම් ව්‍යවස්ථා පැනවීම මෙන්ම දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති තීන්දු කිරීම සඳහා බලය ඇත්තේ ව්‍යවස්ථාදායකයට පමණි.

ලෝකයේ වාමාංශික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආණ්ඩු බොහෝමයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් පනවන කොන්දේසි දේශපාලන වශයෙන් පිළිගන්නේ නැත. ඒ නිසා එවැනි ආණ්ඩු කොන්දේසි සහිතව ණය ලබා ගන්නේ නැත. කොන්දේසි නොමැතිව ණය ලබා නොදෙන බැවින් ආර්ථික අර්බුදයේ තරම කුමක් වුවත් දේශපාලන අර්බුද නිර්මාණය වීම වැළැක්වීම සඳහා එවැනි ආණ්ඩු එම ආයතනවලින් ණය ලබා නොගනිති. එම රටවලදී අදාළ තීන්දු අධිකරණය හමුවේ අභියෝගයට ලක් වූ බවට සාක්ෂි සොයාගත නොහැක. උදාහරණයක් ලෙස ගෝඨාභය රාජපක්ෂ රජය තාක්ෂණික වාර්තාවක නිර්දේශ අනුව එම්.සී.සී. ගිවිසුම අත්සන් නොකර සිටීමට තීන්දු කරනු ලැබීය. ඒ මගින් රජයට ලැබීමට නියමිතව තිබූ ඩොලර් මිලියන 485ක ප්‍රදානය අහිමි වූ බැවින් අලාභයක් සිදු වූ නිසා ආර්ථික අර්බුදය උත්සන්න වූ බවට අධිකරණය හමුවේ ඊට එරෙහිව වෙනත් නඩු පැවරිය හැකිද? එවැනි නඩුවක් පැවරිය හැකි වුවත් ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති පුටුව රැකගෙන සිටියානම් ඊට අදාළව ඔහු වැරදිකරුවෙකු කළ හැකිද?

එසේ වුවත් යම් අවස්ථාවල නඩු පැවරීමක් සිදු වූව ද වැරදි ආකාරයට හෝ චූදිතයින් නිදහස් වන ආකාරයට නඩු පැවරුවහොත් බරපතළ ආර්ථික අපරාධයක් සිදුකළ ද චූදිතයින්ට නිදහස් වීමට අවස්ථාව ලැබේ. උදාහරණයක් ලෙස බැඳුම්කර වංචාවේ චූදිතයන්ට නඩු පවරනු ලැබුවේ පොදු දේපළ පනත යටතේ ය. එහෙත් අල්ලස් සහ දූෂණ පනත යටතේ දූෂණයක් සිදු කළ බවට නඩු පැවරුවේ නම් තත්ත්වය වෙනස් වීමට ඉඩ තිබුණි. බොහෝ අවස්ථාවල පරීක්ෂණ පැවැත්වීම වැළැක්වීම, නඩු පැවරීම වැළැක්වීම සහ වැරදි ලෙස නඩු පැවරීම මගින් බොහෝ ආර්ථික අපරාධ පිළිබඳව සාධාරණ විනිශ්චයක් ලබා දීමට අධිකරණයට ඇති අවස්ථාව අහිමි වෙයි. ඊට අමතරව නව නීතියක් පැනවීම මගින් පවතින නඩුවක චූදිතයන් නිදහස් වන තත්ත්වයක් නිර්මාණය වීම වැළැක්වීම සඳහා අධිකරණයට බලයක් නැත. අප රටේ ඊට අදාළව ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයක් නැත. ඒ නිසා පැරණි විදේශ විනිමය පනත යටතේ අපරාධ වරදකට විත්තිකරුවෙකු වූ රවී කරුණානායක හිටපු අමාත්‍යවරයා නව නීතියක් පැනවීම මගින් නිදහස් කිරීමට 2017 පැවැති ආණ්ඩුවට හැකියාව ලැබුණි.

කෙසේ වෙතත් දේශපාලකයින්ට සහ නිලධාරීන්ට ආර්ථිකයට අදාළව අත්තනෝමතිකව තීන්දු ගත නොහැකි ආකාරයට ව්‍යවස්ථාමය  ප්‍රතිපාදන පනවා ඇති රටවල ආර්ථික අපරාධ සිදු කිරීම සඳහා අවකාශය අවම වේ. උදාහරණයක් ලෙස ඕස්ට්‍රේලියාවේ වෙළඳ ගිවිසුම් පනත නිසා වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීම මගින් ජාවාරම්කරුවන්ට අයුතු වාසි  ලබාදීම මගින් කොමිස් ගැසීමට සහ ඒ මගින් එරට ආර්ථික අර්බුදයට ගොදුරු වන ආකාරයට ආනයන වර්ධනය කිරීමට සහ වෙළඳ හිඟය වර්ධනය කිරීමට ඉඩ නොලැබේ. එම නීතිය මඟින් අදාළ සාකච්ඡාවට සහභාගී වන පිරිස මහජන වගවීමට බැඳී සිටින අතර සාකච්ඡා ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කර ඇත. එසේම ජනාධිපති, අගමැති හෝ ඇමතිවරයකුට තනිවම හිතුවක්කාර තීන්දු ගත නොහැකි වන ලෙස අදාළ ගිවිසුම සහ ඒ මගින් ලැබෙන වාසි සහ අවාසි සවිස්තරාත්මකව තක්සේරු කළ වාර්තාවක් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට නීතිය මගින් ප්‍රතිපාදන පනවා ඇත. එපමණක් නොව පාර්ලිමේන්තුවේදී මහජන අවධානයට ලක් නොවී අදාළ ගිවිසුම හදිසියේ අනුමත කිරීම වැළැක්වීම සඳහා ද ප්‍රතිපාදන පනවා ඇත. ඒ අනුව අදාළ විවාදය පැවැත්විය යුත්තේ ගිවිසුම සහ වාර්තාව න්‍යාය පත්‍රයට ඇතුළත් කර දින 21ක් ගතවීමෙන් පසුව බවට මෙන්ම එය විශේෂ බහුතරයෙන් සම්මත කළ යුතු බවට නීතිමය ප්‍රතිපාදන පනවා ඇත. එම ප්‍රතිපාදන නොසලකා කටයුතු කරන අවස්ථාවල මහජනතාවට අධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකි අතර කෙස් පැලෙන තර්කවලින් තොරව චූදිතයින් වැරදිකරුවන් බවට පත් කළ හැකි ආකාරයට නීතිමය ප්‍රතිපාදනය ඉතා පැහැදිලිව දක්වා ඇත.

ඒ අනුව අධිකරණ නියෝගය මගින් ලැබුණු ඓතිහාසික අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ''දේශපාලනඥයින් විසින් රටේ මහජනයාගේ ජීවිතවලට බලපාන තීන්දු ගැනීමේදී මහජනයාට වග විය යුතුය" යන සංකල්පය දේශපාලන සටන් පාඨයක් බවට පත්කර ගැනීමට දැන් අවස්ථාව ලැබී ඇත.  එවිට අනාගත ව්‍යවස්ථා සංශෝධනයකදී

''සිස්ටම් චේන්ජ්" ඉල්ලා සිටින තරුණයින්ට අදාළ නීතිය අනිවාර්යෙන් පැනවිය යුතු බවට, ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අවශ්‍ය බවට බල කිරීමට බලපෑමක් ඇති වේ. ඊට අමතරව පැපුවා නිව්ගිනියාව වැනි නොදියුණු යැයි කියන රටක ක්‍රියාත්මක වන දියුණු ප්‍රවේශයක් වන ''නායකත්ව හා ආචාරධර්ම පද්ධතියක් නීතිගත කිරීමේ නීතිය" පනවන ලෙස බලපෑම් කළ හැකි වේ. එම නීතිය මගින් සියලුම දේශපාලකයින් සහ ඉහළ නිලධාරීන් ආචාර ධර්ම පද්ධතියකට අනුව තම වගකීම් ඉටු කිරීමට සහ මහජනයාට වග වීමට බැඳී සිටී. ඒ අනුව ඊට අදාළ උල්ලංඝනය කිරීම් පිළිබඳව මහජනයා විසින් ත්‍රි පුද්ගල විනිශ්චය මණ්ඩලයකට පැමිණිලි කළ විට නඩුවට අදාළ වියදම් රජය මගින් දැරිය යුතුවේ. ඒ අනුව වැරදි කිරීම පමණක් නොව තමාට පැවරී ඇති වගකීම සහ බලතල ක්‍රියාත්මක නොකර සිටීම ද දඬුවම් ලැබීමට හේතුවක් වේ. ඒ නිසා එම රටේ ඇමතිලාට උවමනා ආකාරයට තම හෙන්චයියන් ආයතන ප්‍රධානීන් බවට පත් කර ඔවුන් ලවා දූෂණ, වංචා සිදු කිරීමේ හැකියාව අවම වේ.

උදාහරණයක් ලෙස එරට ජාතික ගුවන් සේවයේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර භාර ගැනීමට එරට නිලධාරීන් මැලිකමක් දැක්වීය. ඊට හේතුව එම ආයතනය ගොඩදැමීම පහසු දෙයක් නොවීමයි. ප්‍රතිඵල පෙන්වීමෙන් තොරව, පඩි ලබා ගනිමින් සහ සම්පත් භුක්ති විඳිමින් පුටුව අල්ලාගෙන සිටීමට නොහැකි බැවින් එවැනි තත්ත්වයක් උදා විය. අවසානයේ දී ශ්‍රී ලංකාවේ දක්ෂ වරලත් ගණකාධිකාරිවරයකු විසින් අභියෝගය භාරගත් අතර අද එම සමාගම ලාභ ලබන ආයතනයකි. පුද්ගලයා කෙරෙහි විශ්වාසය තැබීම වැදගත් වුවත් නීතිය සහ ව්‍යවස්ථාව මගින් පුද්ගලයා මෙහෙයවීම ඊට වඩා වැදගත් බව එම ජීවමාන උදාහරණවලින් පැහැදිලි වේ. එම නිසා නඩු තීන්දුවට පසුව ගොඩනැගෙමින් පවතින දූෂණයට, වංචාවට, අදක්ෂකමට සහ අත්තනෝමතිකභාවයට අදාළ සංවාදය යහපත් දිශාවකට යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත. ඒ මගින් දූෂණ, වංචා දිරිමත් නොකෙරෙන ආර්ථික මොඩලයක් නිර්මාණය කිරීම සඳහා ''සිස්ටම් චේන්ජ්" පිළිබඳව කතිකාව ඉහළට එසවීමට හැකියාව ලැබේ. එහිදී දූෂිතයන්ට එරෙහිව පියවර ගැනීමේ වැදගත්කම යටපත් නොකළ යුතුය.

එහෙත් පුද්ගලයන් ඉලක්ක කරමින් ක්‍රියාමාර්ග ගැනීම මගින් එම යහපත් අරමුණු ඉටු නොවේ. එනම් දූෂිත ක්‍රමය ඉතිරි වී තෝරා ගත් පුද්ගලයින්ට හෙවත් යම් පාර්ශ්වයක අවශ්‍යතාව මත ඉලක්ක කළ පුද්ගලයින්ට පමණක් දඬුවම් කිරීමට අවස්ථාව නිර්මාණය කිරීම වරදකි. අධිකරණ තීන්දුව මගින් චූදිතයින් වැරදිකරුවන් බවට පත්කර ඇත්තේ ඔවුන් විසින් සිදු කළා යැයි චෝදනා එල්ල වන දූෂණ වංචාවලට අදාළව නොවේ. එම තීන්දුව මගින් කියැවෙන්නේ ඔවුන් විසින් ගනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තිමය තීන්දු මගින් මහජන විශ්වාසය කඩවී ඇති බවටය. ඒ නිසා යම් පුද්ගලයෙක් පුද්ගලික වෛරය හෝ පටු දේශපාලන උවමනාවන්ට අනුව යෝජනා කරන පරිදි ජනාධිපති කොමිසමක් මගින් අදාළ කරුණු සනාථ කිරීම හා ඔවුන්ගේ සිවිල් අයිතිවාසිකම් අහෝසි කිරීම සඳහා උත්සාහ කිරීම යනු ඉතාම නරක පූර්වාදර්ශයකි. එහෙත් පාර්ලිමේන්තුව සතු ප්‍රතිපත්ති තීරණය කිරීමේ බලයට අදාළව අධිකරණ තීන්දුව පිළිබඳව පාර්ලිමේන්තුව තුළ විවාද කිරීමේ වරදක් නැත. එසේම විධායක ජනාධිපති ක්‍රමය රැකගැනීම සඳහා මරාගෙන මැරෙන ස්වරයෙන් ඉදිරිපත් වන පිරිස අඩු තරමින් ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයාට ලබාදී ඇති අයුතු මුක්තිය අහෝසි කළ යුතු බවට කථිකාවක් ගොඩනැගිය යුතුය. වත්මන් ජනාධිපතිවරයා නඩුවේ පළමු වගඋත්තරකරු වුවද ඔහුට චෝදනාවලින් නිදහස්වීමට අවස්ථාව ලැබෙන්නේ අප රටේ ව්‍යවස්ථාවේ අඩංගු අත්තනෝමතික ප්‍රතිපාදන නිසාය. ඒ පිළිබඳව අධිකරණයට කළ හැකි දෙයක් නැත. එම තත්වය වෙනස් කිරීම මහජනයාගේ සහ පාර්ලිමේන්තුවේ වගකීමකි.

අවසාන වශයෙන් මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා අනාගතයේදී දූෂණය සහ වංචාව පිටුදකින ආර්ථික මොඩලයක් නිර්මාණය කිරීමේ සාකච්ඡාවට අමතරව වංචා සහ දූෂණ පිළිබඳව විභාග කිරීම සඳහා ජනාධිපති කොමිසමක් පත් කිරීම අවම ක්‍රියාමාර්ගයකි. එහෙත් ඒ මගින් රාජපක්ෂලා පිළිබඳව පමණක් නොව අඩු තරමින් 2015 - 2019 පාලන කාලය තුළ තුළ සිදු වූ වංචා දූෂණ පිළිබඳව සොයා බැලිය යුතුය. එසේ නැතහොත් සිදු වන්නේ බෙදුම්වාදී සහ ආගමික අන්තවාදී බලවේග සතුටු කිරීම සඳහා තෝරාගත් පිරිසකගේ හිස ගසා දැමීම පමණි. කෙසේ වෙතත් පවතින තත්වය ගැඹුරින් අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ රාජපක්ෂ විරෝධයේ අවසන් අරමුණ ඔවුන් බියගන්වා යටත් කිරීම බවය. ඒ අනුව එමගින් ඔවුන්ට රනිල් වික්‍රමසිංහ මහතාගේ න්‍යාය පත්‍රය සමග තවදුරටත් අනුගතවීමට බලකෙරෙනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය විය හැක්කේ ඔවුන්ගේ හිස සිඳීමට පෙර ඔවුන් විසින්ම හිස දන්දීම විය හැක. එනම් බෙදුම්වාදීන්ට යුද්ධයෙන් දිනාගත නොහැකි වූ දේ බන්දේසියක තබා ලබා දීමට රනිල් වික්‍රමසිංහ මහතාට උදව් කිරීම මගින් තමා ලබාගත් යුද ජයග්‍රහණයේ ගෞරවය පාවා දෙන්නන්ගේ පාපය සහ ශාපය බවට හැරවීමය.

**දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය**
**2023-12-01**